# පහන් වැට

## නුඹත් මමත්

හමු වූ දෙදෙනෙක්ය,
කහඉර මත
දෙපසට මාරු වන විට,

නිමේෂයකදී දුටු දෙදෙනෙක්ය,
යනෙ'න
උඩට පහළට
විදුලි පියගැට පෙළේ.....

නොකියම් රේල් පීලි දෙකක් යයි,
නමුදු දුම්රිය දෙකකි - දෙපසට ඇදී යන
එකම දුම්රියපළ හමුවුණ
ගමනාන්ත වෙනස් වූ.....

## පමා වී ආ ලිපිය

විඩාබර සතිය තුළ
මඟ බලා ගෙන සිටිය
දෙසතියකට වත් වරක්
ගුවන් තැපෑලෙන් ලැබෙන
සෙනෙහෙබර ඔබෙ ලිපිය
තාම නෑ පමාවට කාරණය

තැපැල්කරු දමා ගිය
දඩ කොලද, බිල් කොලද
ඒ සමඟ වැරදිලා ආ ලිපිද
ඒ අතර ඇවිත් නැත
මා සෙවූ ඒ ලිපිය

කවි වැල්ද, ඔවදන්ද
මුණුබුරා, මිණිබිරිය වෙත
එවූ රස ගඟුලක්ය
ඔබ එවන ඒ ලිපිය
දුරකතන සංවාද වලින් මඟ හැරී ගිය
රට තොටේ ගම අවට හැමදේම
ක්‍ෂණයකින් රැගෙන යයි
මා ගමට ඔබෙ ලිපිය

ඒත් මසකට වැඩියි මඟ බලා සිටින විට
සැකයක්ය මතු වුණේ ඇයි නොලියු කාරණය

දුක හිතෙයි දියණියට මම ලෙඩින් යැයි කියා
ඒ නිසයි නොකියන්න කාරණය අසනීප
අත්වාරු කර ගන්න බැරි නිසයි නොලීවේ
මගෙ දුවේ දුක් නොවෙන්
මම උඹේ සෙනෙහෙ මව !

**ප්‍රමිලා සෙනරත්**

## කවිය

ජීවත් වීම නම්
හදවතත් බුද්ධියත්
නිදැල්ලේ යා නොදී
රැක ගැනීමේ සටනකි

ලිවීම නම්
මොහොතකට වාඩි වී
ආත්මයේ ඇතුලාන්තය
විනිශ්චය කිරීමකි

(ඉබ්සන් ලියූ කවි (2006)
පොතෙන්)
පරිවර්තනය
**ශ්‍රියා කුමාරසිංහ**



## රුවැත්තියක්

සුවඳ කුසුම් සොඳුර අරන්
මුව මීවිත නුදුරු කරන්
මා දෙනුවන ඉනා වතින්
රුව මැවුනා අනුගාමී....

රති රසයට නිගා කරන්
පාරිශුද්ධ ගතිය පෙරන්
චාම් ඇසින් මදෙස බලන්
මහද අරා රසකාමී....

සෙබඩ හඟුම් හද රඳවා
සලෙලු නුවන් කඳුලු නගා
නොතිත් නයන බැලුම් හෙලන්
කිඳුරු රුවැති නයනාවී.....

දිගැති වරල සලා දෙපස
සිහින් රොදින් වසා දෙඇස
හද විමනේ අරක් ගණින්
රුවැති පංචකල්‍යාණී......

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

## බවුන් වැඩීම

සීතල පිනි පොද වරුසා මැඩගෙන
වෙලට ඉහල කඳු වැටිය දිහාවෙන්
අළුයම හිරු රැස් කැරලි නැගෙද්දී
බලාපොරොත්තුව
සිතෙහි පිබිද එයි
පියුමක් විලසින්
අද වත් ලිපියක් ඒවී දෝ?

පිබිදුනු හිරු රැස් වළළු විහිදමින්
කන්දෙන් ගොඩවී වෙලට උඩින් විත්
ටික ටික ලොව උණුසුම පතුරද්දී
බලාපොරොත්තුව
සිතෙහි දැඩිව ඇත
තව ටික මොහොතයි
අද වත් ලිපියක් ඒවී දෝ?

සෙනවැලි මකමින් දා බිඳු ගෙනෙමින්
දැඩි වුනු හිරු ගෙමිදුලටම අවුදින්
ඔච්චම් දෑසෙන් බලා සිටිද්දී
බලාපොරොත්තුව
කැඩී බිඳී යයි
සුසුමන් සමඟින්
හෙට වත් ලිපියක් ඒවී දෝ?

**ර. චන්ද්‍රසූරිය**

## රෝහලේ සිට ....

ලියුකීමියාව.....
භයානක රෝගයක් ලූ
මම අසා ඇත්තෙමි
වැළඳි අය විඳි
දුක් ගැනද ඇසුවෙමි.
කිසිවෙකුට වත් එය
නොවැලඳෙන ලෙස පැතුවෙමි...
දැන් මම එයින් පෙලෙන්නෙමි
මම එයට බිය නැත
සිතේ ශක්තිය ඇත මට
මා පිටුපසින් සිට
මාව දිරිමත් කරන
ප්‍රිය බිරිඳ සමගින
එක්වුන මගේ මිතු කැල
ලොකු ශක්තියකි මට නුඹ
ඔබ සැම කරන ලද
උදවු සහ බෝධි පූජා
තවත් බලයක් විය
වචන නැත තුති පිදුමට
එහෙත් ඔබ සැමට
ස්තුතියි........

**පී. විජේසුන්දර**
CRAIGIEBURN

## කුකුබරා සංදේශය - සිඩ්නි පුර වැනුම

| | |
|---|---|
| සසර දිනූ බුදු සමිඳුට සිරස | නමා |
| ගෙදර බුදුන් සිහිකර හද ඇතිව | පෙමා |
| මෙවරබඳිමි කවි සොඳ උපමේය | දමා |
| නුවර සිඩ්නි වරුණය දනු මිතුරු | තුමා |
| තල්මස් රංචු දඟලන පැසිපික් | සයුරේ |
| මල් ගස්සෙමෙර සලනා නිල් කඳු | අතරේ |
| පෙම් බස් දොඩන වන රොද දකුණේ | උතුරේ |
| සිත් අස්වසයි මායිම් මැද බැඳි | නගරේ |
| ඔපෙරා මැදුර ලොව සුපතල | සලකුණකී |
| ගජරා මෙට සෙනග ගැවසෙන | අඩවියකී |
| මදිරා සුරා පැන් හල් අඩු නැතිය | සකී |
| මිතුරා කැමති නම් රස ගුණ බැලිය | හැකී |
| අහස උසට විහිදෙන සුවිසල් | මැදුරූ |
| පහස ලබති සීතල මේ කුළු | සොඳුරූ |
| දහසසියක් නෙක පැහැ මල් පිපි | පඳුරූ |
| කෙලෙස කවෙන් ඒ රුව වනම්ද | මිතුරූ |
| නගරය මැදින් බැස යන ගංගා | ලලන |
| කරදිය කළපුවෙන් නිමවයි ඇගෙ | ගමන |
| සිතිජය දිගට නෙකවත් පැහැ රුසිරු | ගෙන |
| අසිරිය බලනු සුමිතුර නෞකා | යනෙන |
| කළපුවැඩින් විහිදෙන පාළම | විසල |
| සළකුණු කරයි සිප්කම් වැඩ ලොව | පතල |
| රළ පෙළනගන කරදිය පිරි විල | පතුල |
| බල මැනමිතුර වාහන යති උමං | තුල |
| අරංපිරිස සිය දස ගණනින් | සොඳිනේ |
| උමංතුළින් දුම්රිය යති අතුරු | සැනේ |
| බලං මිතුර නැත දුම්පිට වනු | එයිනේ |
| සොඳින්ජවය විදුලියෙනුය උපද | වුනේ |
| නුවර වට නගර උප ඇත සතර | අතේ |
| පවර මහා මං ජාලෙන් යා | කෙරෙතේ |
| මිතුර යොමනු නෙත් ඊර්ෂ්‍යා නැතුව | සිතේ |
| නතර නාවී යා හැක රතු එළිය | නැතේ |
| අවට නගර බද ගම් සිය ගණන් | ඇතේ |
| සොදට සැදි ගෙවල් දොරවල් නිමක් | නැතේ |
| යසට ජයට සිය ගණනින් දන | වෙසෙතේ |
| සැපටකැමති නැති කවුරුදු කළණ | මිතේ |

**රසික සූරියආරච්චි**

## මිනිස් මුසා.. මිනිස් මුළා..

විඳ විඳ සොඳින් කම්සැප අද ලොවේ දනා....
ගැලි ගැලි ඉඳියි මේ සසරෙම දුකින් සදා......
බුදු බණ මුසාවක් යැයි පල රහිත සිතා.....
මන්දැයි නොතේරේ බොඳුවන් වෙන්නෙ මූලා.....

යදිමින් දෙවොල් වල කෝවිල් වලට යසා
දෙවියන් හටත් හරි හරියට කරති මුසා.....
පුළුවන් කලට මත්පැන් රස බොජුන් කකා....
බැරි උන කලට පන්සල් කෝවිල්ම තමා.....

පන්සල් පැමිණ පවසන්නෙත් මුසා තමා.....
කෝවිල් ගොසින් අයදින්නෙත් ලොවට විනා.....
හැකි හැකි පමණ තම මල්ලම පුරව ගෙනා....
අන් මිනිසුන්ට හෙන ගැහුනත් තකනු එපා.....

ලෙඩදුක් හැදුනාම තේරෙයි මේ ලොව දුකා....
සලකන්නට කෙනෙක් නැති තැන සිතට දුකා..
පුළුවන් කලට අන් අය ගැන නොතැකු එකා...
පණුවන් ගසා දුගඳයි මුළු ගතම මෙදා....

මියැදෙන තලට මේ ලොව හපනුන් දිනෙක.....
සිහියට නැගෙයි කල කී දේ පෙර දවස.....
බිය වෙයි පුදුම වෙයි මේ ලොව සැටි උගෙන...
එතකොට පමා බව සිහියට ගනු මැනව....

යහමින් උපයමින් දහඩිය වගුරමින්
කල හැකි දෙයක් කල මැන අන් අය වෙනුවෙන්
මේ ජීවිතය කෙටි බව සිහියට ගනිමින්....
පින් දම් කරමු අප සැම නොමැලිව යහමින්....

**සුරංග දිසානායක**

## නොනැසෙන උරුමය

වසත් කල දැන් ගෙවී යයි
දිගු වේය කෙටි දහවල ඉතින්
ඉරක් කඩි මුඩියෙන් නැගෙන්නේ
ඇයිද මේ තරහා හිතින්

උදෙත් හරි උණුසුමයි
ගත මැලි කමත් වෙහෙසත් වැඩිය දැන්
එහෙත් රැකියාවට නොගියොතින්
කෙසේ කුස පුරවම්ද මම්

තණ පියලි මත තවම ඇත පිණි
වැදුන මුත් හිරු රැස් පබා
ඇදෙමි දුම්රිය පොලට හෙමිහිට
තණ පලසෙ සටහන් තබා

කිම්ද සිතිවිලි සයුර තුළ
හෝරාව ගත කරනා නියා
වැදෙමි රිය මැදිරියට සුවබර
අසුන කවිලුව ලඟ සොයා

හමන වායුව සැපයි රිය තුළ
ගතේ දාහය නිවෙන්නේ
පායලා හිරු ආවදෙන් දැන්
වගක් මට නැහැ දැනෙන්නේ

ඇත්නම් දකින්නට - හඳුනනා මුහුනක්
සිත් සේ නගන්නට - ලෙන්ගතු සිනාවක්
වෙත් නම් කෙනෙක් මෙහි - වහරනා මා බස්
ලංවී කියන්නට - ආ ගිය කථාවක්

රන් කියඹුවැල් සැලෙන - යුරෝපේ හිම මුහුනු
ඇස් කොන් අගින් නැමුනු - ආසියා කහ මුහුනු
කෙස් කැරලි මුදු ගෙතුනු - දැලි අගුරු කලු මුහුනු
ඉස්සී බලයි මදෙස - නුහුරු සියයක් මුහුනු

එහා අසුනේ හිඳින - සුහද මිනිසා හද
ගැහෙන මෘදු රිද්මය - නෑසේය මොවුනට
සංයුක්ත තැටි ගීය - කන් අගුල වටලාය
දුර කථන පිළිසඳර - සිත් දුරක ගෙන යාය

කව්ලවේ දිග හැරෙන - සැබෑ ලොව පැතිකඩ
නොපෙනේය මොවුනට
පරිගණක තිරය මත - ඇදෙන සිනමාව නෙත
කඩතුරා බැඳලාය
දැහැනෙ සම වැදිලාය.

එකිනෙහි සිහිවීය මට
හයිලෙවල් පාරේ
තාර ගැලවුනු මගදිග
ඇසිල්ලේ ඉගිල යන
ප්‍රයිවට් බස් රථය

කෑලි හැලෙන අසුන් මත
සතුන් සේ ගාල් වූ
ඇඟ මස් කැලී මිරිකෙන
මගෙ දයාබර පිරිවර

බුලත් කහටින් පැහැවූ
දසන් විදහා හිනැහෙන
අයාගත් මුවින් හිඳ
අනුන්ගෙ වග විමසන
මගේ නෑදෑ පරපුර

එකිනෙහි සිහිවිය
ගිනිකූටකේ දැවෙන
මරදාන හන්දිය.
ගිම්හානි අහස්කුස
කලු ධූලි වලා කඩ
ඉරා පොලවට බට

මාතලී රියදුරන්
ත්‍රී රෝද දිව්‍ය රථ - අරා වැඩ හිලුවා
ඩීසල් දුමින් බර - කානු කැලි කසල ගඳ
පුරා පෙනහළු කුහර
සතොසේ ගමන් යන - මගේ නෑදෑ පරපුර

ආසාවක් දැනේ මට - මොහොතකට එහි යන්නට
ආචාර විධි ව්‍යාජ වූ - කසී සළු නොපලන්
උන්ගෙන් එකකු වන්නට
සිනාවක් පා සුහද
නෑකම් කියා අමතා
උන් හා එකතු වන්නට

හැඟීමක් දැනේ සිත
කුමක්දැයි එය නොදැනේ
තෙරපෙනු සෙනඟ අතරින්
එවන් මොහොතක හමුවූ
වාරු නැති මහළු මවට
හුන් අසුන දී මා - හින්ද වූ කල එහි ඈ
පින්සිදු වෙයි පුතේ යැයි
දයාවෙන් මා ඇමතූ - හඬ යළිත් අහන්නට.

අනුරපුර සීගිරි - සඳකඩ පහන් සෙල්ලිපි
වාපි දාගැබ් හෙලිකල - මා ලද උතුම් උරුමය
සැබෑවක් වූ වා සේ

දුගී වූ මඩ ගොහොරුවේ
කරවටක් ගිලී ගිය මේ
නෑදෑ මිතුරු පිරිවර
මට හිමි ඒ උරුමයෙම
කොටසක් නම් නොවන්නෙද

ගැලවිය හැකිද කිසිවට
ඒ වූ සැබෑවෙන් මට,
යොදුන් සිය දහසක් දුර - තව් තිසාවක උන්නත්

**රුක්මලී දසනායක**